**ශීර්ෂය 408 වේවැල් ,පිත්තල,මැටි,ලීබඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

වේවැල් ,පිත්තල,මැටි,ලීබඩු සහ ග්‍රාමීය කර්මාන්ත **ප්‍රවර්ධන** රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වේවැල්,පිත්තල,මැටි,ලීබඩු සහ ග්‍රාමීය කර්මාන්ත **ප්‍රවර්ධන** රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූනි 08 දින ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 අගෝස්තු 18 දින ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වේවැල්, පිත්තල, මැටි, ලීබඩු සහ ග්‍රාමීය කර්මාන්ත **ප්‍රවර්ධන** රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු

අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සංසන්දනාත්මක අගයන් යටතේ දක්වා තිබූ අත්තිකාරම් බී ගිණුම යටතේ වන ලැබීම් හා ගෙවීම් ශේෂ ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 වර්ෂයේ 2 වන වැඩසටහන වෙනුවෙන් පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙන්කිරීම් ලෙස රු.මිලියන 2,000 ක් ලබාගෙන තිබුණද එය මූල්‍ය ප්‍රකාශනයේ ACA 2, 2(i) හා 2(iii) ආකෘතියේ පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන යටතේ නොදක්වා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන යටතේ වූ රු.මිලියන 172 ක්ද සමඟින් රු.බිලියන 2.172 ක් ලෙස වාර්තා කර තිබුණි. | මෙම අගයන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අතපසුවීමකින් මුල් ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙහි සටහන් කර ඇත. එහෙත් ශුද්ධ ප්‍රතිපාදනයෙහි මුළු මූලධන වියදම් රු.මි.2,172 භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව නිවැරදිව සටහන් කර ඇති බව. | වර්ෂය තුළ ලබාගත් පරිපූරක ඇස්තමේන්තු මූල්‍ය ප්‍රකාශනයේ පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන යටතේ දැක්විය යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයන් 04 ක් සඳහා මු.රෙ. 66 යටතේ රු.19,450,000 ක ප්‍රතිපාදන මාරුකර ගෙන තිබුණි. ඒ අනුව ප්‍රතිපාදන මාරුකිරීම් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 110 සිට 213 දක්වා පරාසයක වූ බැවින් වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී අවශ්‍යතා නිසි ලෙස හඳුනාගෙන කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | මෙම වැය විෂයන් යටතේ වූ අත්‍යාවශ්‍ය ගෙවීම් සිදු කිරීම සඳහා වියදම් කළමනාකරණය තුලින් ප්‍රතිපාදන ඉතිරිකර ගත් වැය විෂයන් ගෙන් මු.රෙ.66 යටතේ ප්‍රතිපාදන මාරු කර ගෙන ඇති බව . | වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී අවශ්‍යතා නිසි ලෙස හඳුනාගෙන හැකිතාක් දුරට සම්පූර්ණවත් නිවැරදිවත් පිළියෙල කළ යුතුය. |

## 2.2 අත්තිකාරම් නිකුත් කිරිම හා පියවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ණය මුදල ගෙවා අවසන් වීමට පෙර විශ්‍රාම ගොස් සිටින නිලධාරීන් 03 දෙනෙකුගෙන්, මියගිය නිලධාරීන් 04 කුගෙන් සහ සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 04දෙනෙකුගෙන් අයවිය යුතු රු.655,706 ක ණය ශේෂයන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 වගන්තිය ප්‍රකාරව කටයුතු කර අයකරගෙන නොතිබුණි. | නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂයන් නිරවුල් කිරීම සඳහා පියවර ගනිමින් පවතින බව. | ආයතන සංග්‍රහයේ **XXIV** පරිච්ඡේදයේ **4.5** වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) එක් ග්‍රාම නිලධාරී වසමකට එක් ග්‍රාමීය කර්මාන්ත ව්‍යවසායකයෙක් බිහිකිරීම සඳහා වූ විශේෂ ව්‍යාපෘති යටතේ රු.මිලියන 800 ක් වෙන්කර තිබූ අතර ඉන් ව්‍යවසායකයින් 14,016 ක් බිහිකිරීමට සැලසුම් කර තිබුණි. එසේ වුවද 2021 දෙසැම්බර් 31 දිනට වූ ප්‍රගතිය අනුව ව්‍යවසායකයින් 12,388 ක් තෝරාගෙන ඒ සඳහා රු.මිලියන 649.33 ක ප්‍රතිපාදන වැය කර තිබූ අතර එම තෝරාගත් ප්‍රතිලාභීන්ට ප්‍රාදේශීය සංවර්ධන කමිටු අනුමැතිය ලැබීම සියයට 47ක මට්ටමේ පැවතුණෙන්, වර්ෂය තුළ අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. | තෝරාගනු ලැබූ ප්‍රතිලාභී නාම ලේඛණ සඳහා ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ එකඟතාවය ලබා ගැනීම සඳහා ප්‍රථම අදියරයේදී රටේ පැවති අයහපත් සෞඛ්‍ය තත්ත්වය මත ප්‍රමාදයක් සිදුවුවද, සියළු ප්‍රතිලාභී නාම ලේඛනයන් සඳහා ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ අනුමැතිය ලබා ගන්නා ලදී. | ව්‍යාපෘති යටතේ වූ අපේක්ෂිත අරමුණු වර්ෂය තුළ ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) ග්‍රාමීය කර්මාන්ත නිෂ්පාදනවල අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වෙන් කළ රු.මිලියන 30 කින් වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට වෙන් කළ මුදල රු.මිලියන 9කින් වැඩිකරගැනීමට අනුව ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම්ද සංශෝධනය කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. | අතපසුවීමකින් සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමට නොහැකි වූ බව. | ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමෙන් පසුව එයට සිදුකරන සංශෝධන ඇතුළත් කර සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර එය අනුමත කර ගත යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූලධන වත්කම් අත්පත්කර ගැනීම් රු.23,786,145 ක් වුවද මූල්‍ය නොවන වත්කම් වාර්තාවෙහි වර්ෂය තුළ මිලදී ගැනීම් යටතේ දක්වනු වෙනුවට ආරම්භක ශේෂයට ගලපා තිබුණි. | මිලදී ගැනීම් මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ ආරම්භක ශේෂයට එකතු කිරීම් යටතේ (Add to Opening Balance) ඇති එකතුව වන රුපියල් 103,880,754 ට ඇතුලත්ව ඇත. | වර්ෂය තුළ අත්පත්කර ගත් වත්කම් මූල්‍ය ප්‍රකාශනයේ ,මූල්‍ය නොවන වත්කම් වාර්තාවෙහි වර්ෂය තුළ මිලදී ගැනීම් යටතේ දැක්විය යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරුවලින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 03 දෙනෙකු, ද්විතියික මට්ටමේ නිලධාරීන් 03 දෙනෙකු සහ ප්‍රාථමික මට්ටමේ එක් නිලධාරියකුගේ පුරප්පාඩු පැවති අතර අවශ්‍යතාව හඳුනාගෙන එම තනතුරු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා අංක **SMRIP/ES/02/01** හා **2021.02.17, 2021.11.14** හා **2021.12.27** දිනැති ලිපි මගින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය |